# ඩිජිටල් ක්‍රියාකාරිත්වය

කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන

චිත්‍ර: සුගප්‍රදා සෝමාස්කන්ද අයියර්

# ඩිජිටල් ක්‍රියාකාරීත්වය

## හැඳින්වීම

ක්‍රියාකාරීත්වය යනු සමාජීය හෝ දේශපාලන වෙනසක් ඇති කිරීමේ අරමුණින් සාමකාමීව ප්‍රශ්න කෙරෙහි අවධානය කිරීමයි..

ඩිජිටල් ක්‍රියාකාරීත්වය (හෙවත් සයිබර් ක්‍රියාකාරීත්වය) යනු අන්තර්ජාලය සහ අනෙකුත් ඩිජිටල් තාක්ෂණයන් ජනතාව දැනුම්වත් කිරීමට හා ප්‍රශ්න සඳහා විසඳුම් සෙවීමට භාවිත කිරීමයි.




ක්රාක්!



ආණ්ඩුව ගනන් ගන්නේ නෑ.
පෙත්සමට උත්තරේකුත් නෑ.
දැන් අවුරුද්දකුත් උනා.
තාම හදල නෑ.
ආපු දෙන්කො ඊලඟ ඡන්දෙට.
අපිට මුකුත් කරන්න බැරිද?
අපි වීඩියෝ එකක් හදමු.
එක හොඳයි.
ඒක ඉන්ටර්නෙට් එකේ දාමු.


REC
ගංවතුර හේතුවෙන් පාලම කැඩී වසරක් ගතවී ඇත. රජය පාලම නැවත ඉදිකරන බවක් නොපෙනේ. #fixthebridge
පෝස්ට් එක වයිරල් ගියා.
Share


24000 ශෙයාර්ස්!!!
මේ නැති වෙන්නෙ මගේ ඡන්ද පදනම.
පාලම හදපල්ලා.


ඔබේ ජංගම දුරකථනය සහ අන්තර්ජාලය භාවිතයෙන් ඔබට සමාජයේ ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඔබේ ප්‍රජාවේ ගැටළු වලට විසඳුම් සෙවීමද කල හැක.

# උගත් පාඩම්

බොහෝ සාර්ථක අන්තර්ජාල ක්‍රියාකාරීන් විවිධ උපායමාර්ග යොදාගෙන ඇත.
එහි උදාහරණ කිහිපයක් පහතින්:

## අන්තර්ජාල පෙත්සම්:

නිවැරදි ප්‍රතිචාර ලැබේ නම් මෙය විශිෂ්ට මෙවලමකි. සමහර පෙත්සම්වල ලක්ෂ සංඛ්‍යාත පුද්ගලයින් අත්සන් කර ඇත. මෙය සිදු කළ විට අදාළ රජයන්ට සහ ආයතනවලට එය නොසලකා හැරීමට අවස්ථාවක් නැත.

## හැෂ්ටැග් (Hashtag):

හොඳ හැෂ්ටැග් එකක් ඔබ බෙදාගන්නා තොරතුරු වර්ග කිරීමට උපකාරී වන අතර, පරිශීලකයන්ට ට්විටර්, ඉන්ස්ටග්‍රෑම්, ෆේස්බුක්, රෙඩිට් සහ යූටියුබ් වැනි සමාජ මාධ්‍ය හි නිශ්චිත මාතෘකා සහිත පණිවිඩ සොයාගැනීමේ  හැකියාව මින් ලැබේ.